**ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය**
**Business & Accounting Studies**

| 81 | S | II |
|---|---|---|

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) තරග විභාගය 2008 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2008 டிசெம்பர்
Genaral Certificate of Education (Ord. Level) Examination, August 2008

**ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II**
**வணிகக் கல்வியும் கணக்கீடும் II**
**Business and Accounting Studies II**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hour*

❖ පිළිතුරු ලිවීමේ දී පැහැදිලි අත් අකුරෙන් ලියන්න.

---

## I කොටස

ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

01. (i) රටක ජාතික ආදායම වැඩිවන විට භාණ්ඩ හා සේවා වලට ඇති ඉල්ලුම පුළුල් වන්නේ ඇයි. ?
(ii) ප්‍රමිත ලාංඡන සහිත භාණ්ඩ මිලදී ගැනීමෙන් ගැණුම්කරුවෙකුට අත්වන වාසි 2ක් සඳහන් කරන්න.
(iii) පාරිභෝගික භාණ්ඩ වර්ග කර දක්වන්න.
(iv) චෙක්පතක චුම්බක තීන්ත අක්ෂර තීරුවේ (MIRC) ඇතුළත්වන කරුණු 4ක් ලියන්න.
(v) ප්‍රවාහනයේ මූලිකාංග මොනවාද?
(vi) ගිණුම්කරණ තොරතුරු පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශව 2ක් නම් කරන්න.
(vii) ලෙජරය යනු කුමක් ද?
(viii) චෙක්පත් වර්ග දෙක නම් කරන්න.
(ix) ප්‍රාථමික පිරිවැය යනු කුමක් ද?
(x) මූලාශ්‍ර ලේඛණ 4ක් නම් කරන්න.

## II කොටස A - ව්‍යාපාර අධ්‍යයනය

02. i. "භාණ්ඩ හුවමාරුව කාලය සහ පරිශ්‍රමය අපතේ යාමකි" මෙම කියමන සනාථ කිරීමට කරුණු දෙකක් ලියන්න.
ii. කෙටිකාලින හා දිගුකාලින අරමුදල් අවශ්‍යතාවයන් සපයන වෙළෙඳ පොළවල් දෙක නම් කරන්න.
iii. ශ්‍රී ලංකාවේ සුරැකුම්පත් හා විනිමය කොමිසම යනු කුමක්ද?
iv. මූල්‍ය කල්බදු මෙහෙයුම් කල්බදු වලින් වෙනස් වන කරුණු 2ක් ලියන්න.
v. විවෘත වෙළෙඳ පොළ ක්‍රමයේ ඇති වාසි 2ක් ලියන්න.

03. i. බැංකු පොළී අනුපාතිකය පහත වැටෙන විට නිෂ්පාදනය පුළුල් වේ. පැහැදිලි කරන්න.
ii ණය කාඩ්පතක (Credit Card) හා ටෙලර් කාඩ්පතක (Teller Card) වෙනස කුමක්ද?
iii. කුලිපිට ගැණුම් ක්‍රමය හා විලම්බිත ගෙවුම් ක්‍රමය අතර වෙනස පැහැදිලි කරන්න.
iv. කේවල ස්වාමි ව්‍යාපාරයක් හවුල් ව්‍යාපාරයත් අතර ඇති අසමානකම් 4ක් දක්වන්න.
v. වෙළෙන්දෙකු රු. 800,000 ක් වටිනා ගොඩනැගිල්ලක් රු. 80,000 කට රක්ෂණ ඔප්පුවක් ලබා ගෙන ඇත. ඔහුගේ ගොඩනැගිල්ලේ කොටසක් ගින්නෙන් දැවී ගියේය. එම කොටසේ වටිනාකම රු. 180,000 නම්, ඔහුට ලැබෙන වන්දි මුදල ගනනය කරන්න.

## II කොටස B - ගිණුම්කරණ අධ්‍යයනය

04. අ. පහත සඳහන් ගනුදෙනු
ප්‍රාග්ධනය + ආදායම් + වගකීම් = වත්කම් + වියදම් යන සමීකරණයට ඇතුළත් කර පෙන්වන්න.
1. ප්‍රාග්ධනය යෙදුවා රු. 100,000
2. ණයට භාණ්ඩ ගත්තා රු. 12,000
3 ගෙවල් කුලි ලැබුණා රු. 10,000
4. ණයගැතියන්ගෙන් මුදල් ලැබුණා රු. 5,000
5. අත්පිට මුදලට බඩු වික්කා රු. 3,000

ආ. පහත සඳහන් ගනුදෙනු සඳහා ද්විත්ව සටහන් ලියන්න.

1. ගෘහභාණ්ඩ මිලට ගත්තා රු. 35,000 යි.
2. ණයට භාණ්ඩ වික්කා රු. 8,000 යි.
3. අයිතිකරු පෞද්ගලික ප්‍රයෝජනයට ගත්තා රු. 2,000 යි
4. සංග්‍රහ ගාස්තු ගෙව්වා රු. 1,500 යි
5. ණයහිමියන්ට මුදල් ගෙව්වා රු. 4,000 යි.

ඇ. ත්‍රිත්වතීරු මුදල් පොතක වට්ටම් තීරු තුලනය නොකරන්නේ ඇයි. ?

ඈ. තරුපතිගේ ව්‍යාපාරයේ 2008 ජනවාරි මාසයට අදාල සුළු වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | | | | රු. |
|---|---|---|---|---|
| 2008 | ජනවාරි | 01 | අතඉතිරි | 48 |
| | | 01 | අග්‍රිමය ප්‍රතිපුරණය කිරීම සඳහා ප්‍රධාන මුදල් පාලකගෙන් මුදල් ලැබුණා | 652 |
| | | 03 | පුන්‍ය ආයතනයකට පරිත්‍යාග කළා | 100 |
| | | 06 | සංග්‍රහ වියදම් | 50 |
| | | 08 | මුද්දර හා ලිපි කවර | 45 |
| | | 13 | බස් කුලි | 35 |
| | | 17 | සමිතියට දුන් මුදල | 75 |
| | | 21 | යතුරු ලියන කඩදාසි | 80 |
| | | 25 | ගමන් වියදම් | 40 |
| | | 27 | විදුලි පණිවිඩ | 95 |
| | | 30 | පුටුවක් මිලදී ගත්තා | 250 |
| | | 31 | අග්‍රිමය ප්‍රතිපුරණය කළා | |

ඉහත සඳහන් තොරතුරු තැපල්, ලිපිද්‍රව්‍ය, ගමන්, විවිධ හා ලෙජර යන තීරු වල ඇතුලත් කර සුළු මුදල් පොතක ලියා දක්වන්න.

05. අ. 2008 ජුනි 30 දිනට සාලියගේ ව්‍යාපාරයේ මුදල් පොතේ පරිදි බැංකු ශේෂය රු 8,400 ක් විය. එදින ලද බැංකු ප්‍රකාශණයේ ශේෂය මීට අසමාන විය. වෙනසට හේතු මෙසේ සොයා ගන්නා ලදි.

1. තැන්පත් කළ නමුත් ගිණුමට බැර නොවූ චෙක්පත් රු. 2800
2. ණයගැතියෙකු කෙලින්ම බැංකුවට බැර කරන ලද රු. 1,500 ක් මුදල් පොතේ සටහන් වී නැත.
3. නිකුත් කළමුත් ගෙවීමට මෙතෙක් බැංකුවට ඉදිරිපත් නොවූ චෙක්පත් වල වටිනාකම රු. 3,800 කි.
4. මුදල් පොතේ බැංකු තීරුවට රු. 1,560 හර කරනවා වෙනුවට රු. 6,510 ලෙස හර කර ඇත.
5. චෙක්පොත් ගාස්තු හා බැංකු ගාස්තු පිළිවෙලින් රු. 250ක් හා රු. 400 මුදල් පොතේ සටහන් කර නැත.

ඔබ විසින්,

1. 2008 ජුනි 30 දිනට සංශෝධිත මුදල් පොත
2. 2008 ජුනි 30 දිනට බැංකු සැසඳුම් විස්තරය පිළියල කරන්න.

ආ. චන්දුගේ ව්‍යාපාරයේ 2007.12.31 දිනට පිළියෙළ කරන ලද ශේෂ පිරික්සුම සමාන නොවූ හෙයින් වෙනස අවිනිශ්චිත ගිණුමකට මාරු කරන ලදි. පසුව සොයා ගත් වැරදි මෙසේය.

1. ගොඩනැගිලි අලුත් වැඩියාව රු. 8,000 ගොඩනැගිලි ගිණුමට හර කර තිබීම.
2. රු. 3,000 ක ගැණුම් ඉන්වොයිසියක් පොත් වල සටහන් කර නැත.
3. රු. 8,500 ක කාර්යාල උපකරණ ගිණුමක ශේෂය, ශේෂ පිරික්සුමට ගෙන ගොස් නොමැත.
4. කමල් විසින් ආපසු එවන ලද රු. 1,500 ක භාණ්ඩ ආපසු එවුම් ගිණුමේ බැරට රු. 150 ලෙස සටහන් කිරීම.

    1. ඉහත වැරදි නිවැරදි කිරීමට අදාළ ජ'නල් සටහන් පෙන්වන්න.
    2. අවිනිශ්චිත ගිණුම පෙන්වන්න.

**සා.පෙළ ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන දේශක**

**සිසිර කුමාර විසින් සම්පාදිත යි.**

%